<u>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය</u>.

**<u>මිල ගණන් කැඳවීම.</u>**

**<u>අනුරාධපුර සහ නුවරඑළිය නිවාඩු නිකේතන පිහිටුවීම සඳහා බදු පදනම මත නිවාස ලබා ගැනීම.</u>**

**<u>BOI/S&S/O/084/2024</u>**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයන්හට නවාතැන් පහසුම් සැපයීම සඳහා නිවාඩු නිකේතන ලෙස භාවිතා කිරීමට අනුරාධපුර හා නුවරඑළිය ප්‍රදේශයන්හි යෝග්‍ය පරිසරයක පිහිටි නිවාස වර්ෂ තුනක (03) කාලයක් සඳහා බදු පදනම මත ලබාගැනීම මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

1. අනුරාධපුර - වායු සමනය කල හා යාබද නාන කාමර සහිත අවම කාමර සංඛ්‍යාව පහත පරිදිවේ.

   1.1. යුගල ඇඳන් සහිත (Double bed) කාමර තුනයි.
   1.2. තුන් දෙනෙකුට පහසුකම් සහිත කාමර (Family Room ) එකයි.

2. නුවරඑළිය - අවම කාමර සංඛ්‍යාව පහත පරිදි වේ.

   2.1. යුගල ඇඳන් සහිත (Double bed) 04 යි.
   2.2. තුන් දෙනෙකුට පහසුකම් සහිත කාමර ( Family Room) 01 යි.

**යෝජිත නිවාස පහත සඳහන් පහසුකම් වලින් යුතුවීම අනිවාර්ය වේ.**

1. නිවස වටා ඉදිකරන ලද ආරක්ෂිත වැටක් හෝ තාප්පයක් තිබීම.
2. නිවස ඉදිරිපස නිරීක්ෂණය කිරීම සඳහා CCTV පද්ධතියක් තිබිම.
3. වාහන දෙකක් ගාල් කිරීම සඳහා පහසුකම් තිබීම.
4. ඉහල ප්‍රමිතියෙන් යුතු ගෘහ භාණ්ඩ වලින් මුළු නිවසම සමන්විත වියයුතුයි.
5. සියළුම කාමර සඳහා රූපවාහිනී යන්ත්‍රයක්, Peo TV/ Dialog TV සහ wifi සම්බන්ධතාවය තිබිම.
6. මුළුතැන්ගෙයක් හා ආහාර ගැනීමේ පහසුකම් සහිත විසිත්ත කාමරයක් තිබීම.
7. ආහාර පිසීම, නිවාස පිරිසිදු කිරීම ඇතුළු සියළු කටයුතු සඳහා හැකියාව ඇති නිවාස භාරකරුවකු/අරක්කැමිවරයෙකු නිවස අයිතිකරු බලයලත් අය විසින් සැපයිය යුතු අතර ඔහුගේ වැටුප් හා ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම, අයිතිකරු/බලයලත් අය විසින් සිදුකල යුතුයි.
8. රියදුරු මහතුන්ට හා නිවාසයේ භාරකරු /අරක්කැමි වෙනුවෙන් කාමර පහසුකම් හා ඔවුන්ගේ සනීපාරක්ෂක කටයුතු සුදුසු ස්ථානයක් තිබීම.
9. ගිවිසුම ගත කාලය තුල රුපියල් 10,000/- (රුපියල් දස දහසක්) නොඉක්මවන නඩත්තු අලුත්වැඩියාවන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සිදු කරන අතර රුපියල් 10,000/- (රුපියල් දස දහසක්) ඉක්මවන නඩත්තු අලුත්වැඩියාවන් හිමිකරු / බලයලත් පුද්ගලයා විසින් දැරියයුතුය.

**පහත සඳහන් විස්තර සමඟ මිල ගණන් ඉදිරිපත් කල යුතුය.**

- නිවසේ හිමිකරුගේ නම සහ ලිපිනය හා දුරකථන අංකය ( නිවසේ හිමිකරුවන් හෝ බලයලත් පුද්ගලයන් පමණක් මිල ගණන් ඉදිරිපත් කල යුතුය)
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත බදු පදනම මත නිවස ලබාදීමට කැමැත්ත ප්‍රකාශ කරන හිමිකරුගේ /බලයලත් අයගේ අත්සනින් යුතු ලිපියක්.

- නිවසේ පිහිටීම, වර්ග අඩි ප්‍රමාණය, බිම් සැලැස්ම සහ අයිතිය සනාථ කරන ලේඛන පිටපත්.
- නිවසෙහි හා නිවස අවට පරිසරයෙහි ඡායාරූප සහ පොදු පහසුකම් පිළිබඳ විස්තර.
- මාසික බදු කුලිය හා බදු කොන්දේසි ( බාරකරු/අරක්කැමිගේ වැටුප් ඇතුළත්ව)

**සැලකිය යුතුය** -

නිවස පරීක්ෂා කිරීමෙන් අනතුරුව පමණක් තෝරා ගැනීම සිදුකරනු ලබන අතර තෝරාගත් නිවසේ හිමිකරුවන් ආයෝජන මණ්ඩලය සමග බදු ගිවිසුමකට එළඹිය යුතුය. නගරයට ආසන්න නිස්කලංක පරිසරයක පිහිටි ගෙමිදුලක් සහිත ස්ථානයක්වීම වඩාත් සුදුසු වේ.

මුද්‍රා තබන ලද සියළු විස්තර ඇතුළත් මිළ ගණන් අදාළ පරිදි 'අනුරාධපුර' හෝ 'නුවරඑළිය' යනුවෙන් කවරයේ වම්පස කෙළවරේ සඳහන්කර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, අධ්‍යක්ෂ (පරිපාලන) බාරේ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, 09 වන මහල, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල, කොළඹ 01 යන ලිපිනයට **2024 අගෝස්තු 26 දින ප.ව. 02.00 ට** පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට කටයුතු කල යුතුය. එදිනම ප.ව. 2.00 ට මිළ ගණන් විවෘත කරනු ලබන අතර මිල ගණන් ඉදිරිපත් කරන අයට හෝ ඔහුගේ නියෝජිතයාට එම අවස්ථාවට සහභාගි විය හැක. ප්‍රමාදවී ලැබෙන මිළ ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වැඩි විස්තර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) වෙතින් දුරකථන අංක 0741531432 වෙතින් ලබාගත හැක.

**සභාපති**
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය